127

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**

ශාස්ත්‍රවේදී පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 ජනවාරි/ පෙබරවාරි
ආර්ථික විද්‍යාව

## ECON 1210.3/ ECON 1210 - සාර්ව ආර්ථිකවිද්‍යා මූලධර්ම

---

**කාලය : පැය තුන (03) යි.**
**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. (i) සාර්ව ආර්ථික විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය සහ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) සාර්ව ආර්ථික විද්‍යාවේ අරමුණු, ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති උපකරණ මොනවා ද? (ලකුණු 10 යි)

02. (i) අතරමැදි සහ අවසාන භාණ්ඩ හා සේවා අතර වෙනස කුමක් ද? (ලකුණු 04 යි)

(ii) ජාතික ගිණුම් සංඛ්‍යාවල වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තුවල සිදු වූ මෑතකාලීන වෙනස්කම් මොනවා ද?

(ලකුණු 07 යි)

03. සංවෘත ආර්ථිකයකට අදාළ පහත තොරතුරු ඔබට සපයා ඇත. (සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.)

$C = 50 + 0.80Yd$

$I = 200$

$G = 100$

$T = 50$

(i) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම කොපමණ ද? (ලකුණු 03 යි)

(ii) සමතුලිත ජාතික ආදායමේදී ඉතුරුම් කොපමණ ද? (ලකුණු 03 යි)

(iii) රජයේ වියදම් (G) රු. මිලියන 125 දක්වා ඉහළ ගියේ යැයි සිතන්න. නව සමතුලිත ජාතික ආදායම කුමක් ද? (ලකුණු 03 යි)

(iv) සමතුලිත ජාතික ආදායම රු. මිලියන 2200ක් නම් ආයෝජන වියදම්වල (I) වටිනාකම කොපමණ ද? (ලකුණු 03 යි)

(v) රාජ්‍ය වියදම් සහ බදු ගුණක ගණනය කරන්න. (ලකුණු 04 යි)

04. (i) සේවා වියුක්ති වර්ග අර්ථ දක්වන්න. (ලකුණු 06 යි)

(ii) සේවා වියුක්තිය ආර්ථිකයකට ඇති කරන බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

05. (i) උද්ධමනය, නිරුද්ධමනය සහ මූලික උද්ධමනය යන සංකල්ප නිර්වචනය කරන්න. (ලකුණු 05 යි)

(ii) උද්ධමනය පිළිබඳ කේන්සියානු විග්‍රහය කුමක් ද? ප්‍රස්ථාරයක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iii) මුදල් ඉල්ලුම සඳහා බලපානු ලබන චේතනා මොනවා ද? පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

06. (i) මුදල් සැපයුම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ii) මුදල් සැපයුම තීරණය කරන සාධක මොනවා ද?

(iii) මුදල් ප්‍රතිපත්තියේ අරමුණු මොනවා ද?

(iv) මුදල් සැපයුමේ වෙනස්වීම පොළී අනුපාතිකය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(එක් කොටසකට ලකුණු 04 බැගිනි.)

07. පහත සංකල්පවලින් හතරක් (04) පැහැදිලි කරන්න.

(i) සරල ආර්ථිකයක ජාතික ආදායමේ චක්‍රාකාර ප්‍රවාහය

(ii) වාණිජ බැංකුවල මුදල් මැවීමේ ක්‍රියාවලිය

(iii) ඕකුන්ගේ නීතිය (Okun's Law)

(iv) අධිබලැති මුදල්

(v) ඉතුරුම් හා ආයෝජන

(vi) ඒක පුද්ගල ආදායම

(එක් කොටසකට ලකුණු 04 බැගිනි.)